
# උක් සමග අතුරු බෝගත් වවන්න

උක් දඬු හිටවලා උක් කපා ගන්න අවුරුද් දක් විතර ගත වෙනවා. ඊටත් වැඩිය මුල් මාස තුන හතරේ උක් පැලය වැඩෙන්නේ හරි හෙමින්. උක් වගාවකට මුදල් යොදවන ගොවි මහත්වරුන්ට අවුරුද්දක්ම බලන් නොඉඳ ඉක්මන් අතිරේක ආදායමක් ලබා ගත හැකි ක්‍රමයක් ගැනයි මේ ලියන්නේ. උක් ගහට හානියක් නොකර උක් පේලි අතරේ ඇති ඉඩ ප්‍රමාණයේ අතුරු බෝග වගා කරල හොඳ ලාබයක් ගන්නා හැටි මේ පිළිබඳව කරපු පරීක්ෂණවලින් සොයාගෙන තියෙනවා.



උක් සමඟ සරුවට වැවී ඇති මාළු මිරිස් වගාවක් – මෙයින් ඉතා ඉහළ අතුරු ආදායමක් ලබා ඇත


**ඉන්දියානු ගොවි පර්යේෂණ ආයතනය** මගින් කරපු මෙම පරීක්ෂණවලදී එක් එක් අතුරු බෝග වලින් ගොවි මහත්වරුන්ට ගන්න පුළුවන් ලාභ, පල්දුව ගැන එහෙම හොඳට බල්ලා තියෙනවා. වියළි දේශගුණ යක් ඇති උතුරු ඉන්දියානු ප්‍රදේශවළයි මෙම අත්හද බැලීම් කළේ. ඒක නිසා අපටත් ඒවා ගැලපෙනවාට සැකයක් නැහැ. උක්–වම්බටු, උක්–තක්කාලි, උක්–මාළුමිරිස්, උක්–මිරිස්,උක් එැනු හා උක් විතරක් යන විදිහටයි මේ අතුරු බෝග වගාව සකස් කරලා තියෙන්නේ. මේවා ශ්‍රී ලංකාවේ අපේත් සාමාන්‍ය එළවළු වර්ගනේ.

මූලික වගාව වන උක් ගහටයි අතුරු බෝග වලටයි දෙකටම ගැලපෙන දේශගුණයක් තමයි මේ විදිහේ අතුරු බෝග වගාවට හරි යන්නේ. උක් දඬුයි, එළවලූයි හිටවන කාලේ එකිනෙකට වෙනස් හින්දා, එළවළු පැල තවාන් හදා ගන්න ඕනෑ. ඊට පස්සේ උක් දඬු හිටවන්න ඉඩ තියලා වම්බටු, මාළු මිරිස්, පැල තවානෙන් ගලවලා පේලිවලට හිටවන්න ඕන. තක්කාලිවලට විතරක් පස් ටිකක් එකතු කරලා බිම උසට හිටින විදිහට පැලය හිටවන එක වඩා හොඳයි. අතුරු වගාව අතරේ පහත තියෙන තරමට ඉඩ තියන්න ඕන.

| | | | | |
|---|---|---|---|---|
| 1. | වම්බටු | 36'' | x | 18'' |
| 2. | තක්කාලි | 36'' | x | 12'' |
| 3. | මාළුමිරිස් | 36'' | x | 12'' |
| 4. | මිරිස් | 36'' | x | 12'' |
| 5. | එැනු | 6'' | x | 4'' |

එැනු පේලි අතර පරතරය අඩු නිසා, අඟල් හයෙන් හයට පේලි පහක් සිටවලා පේලි පහෙන් පහට අඟල් දොළහක ඉඩ තබන්න ඕනෑ. මේ විදිහට සිටෙව්වහම හැම අතුරු බෝගයක් අතරම උක් දඬු අඟල් 36 ක පර තරයට සිටවන්න පුළුවන්.

උක් දඬු හිටවන කාලේ ලංවුනාම එළවලු පැල පේලි දෙකක් අතරේ බිම සලි හාරා



වම්බටුද උක් සමග හොඳින් වැවිය හැකි නවත් අතුරු වගාවක්. වම්බටු වලින්ද මාළු මිරිස් තරම් ආදායමක් ලැබේ.

සකස් කර උක් අඩු පේලිවලට හිටවන්න. ඊට පස්සේ උක්වලටයි එළවළුවලටයි ඕන පෝර ඒවා වෙනම හිටවූ විට දමන විදිහටම දමන්න පුළුවන්. ඇත්තෙන්ම එකළඟ හිටවූවාට මේ බෝගවල විවිධ වගා පිළිවෙත් ඒ විදිහටම කරන්න ඕන. කිසි වැරද්දක් නැහැ ඒකේ.

මේ වගේ වෙනස් බෝග එකට වවන විට බෝගවල විවිධ ගති නිසා කෘමීන් වැන්නවුන්ගෙන් වන හානි හුඟාක් අඩු වෙන බවත් සොයා ගෙන තියෙනවා. රතුළූනු මේකට කදිම උදාහරණයක්. රතුළූනුවල සැර ගතිය නිසා උක් ගස්වලට හානි කරන කඳ විදින පනුවන්ගෙන් උක් ගස් බේරා ගැනීමට හැකිවී තියෙනවා.

මෙම අතුරු බෝග එකට වගා කිරීමෙන් අක්කරයකින් ලබාගන්න පුළුවන් ආදයම මෙහෙමයි:

| | පලදව හොණ්ඩර | ආදයම රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|
| **1. උක්—රතුළූනු** | | | |
| උක් | 273 | 722/- | |
| ළූනු | 205 | 452/- | 5,074/- |
| **2. උක්—තක්කාලි** | | | |
| උක් | 348 | 890/- | |
| තක්කාලි | 60 | 2,900/- | 3,790/- |
| **3. උක්—මාළුමිරිස්** | | | |
| උක් | 356 | 866/- | |
| මාළුමිරිස් | 30 | 2,484/- | 3,350/- |
| **4. උක්—මිරිස්** | | | |
| උක් | 374 | 992/- | |
| මිරිස් | 40 | 2,650/- | 3,642/- |
| **5. උක්—වම්බටු** | | | |
| උක් | 372 | 978/- | |
| වම්බටු | 68 | 2,336/- | 3,314/- |
| **6. උක්** | 416 | 926/- | 926/- |

මේ ආදයම් විස්තර බැලුවහම එකපාරටම හිතෙයි උක් වවනවාට වඩා එළවළු විතරක් වවන එක ලාබය කියලා. ඒ වුනාට අපිට ඕනි, පැණි එහෙමත් නිතර දෙවේලේම ඕන කරන වානේ. උක් විතරක් හිටවලා අවුරුද්දක් නිකම් තියෙන ඉඩෙන් මේ වාගේ කල් නොයන එළවළු වැවීමෙන් සෑහෙන අතිරේක ආදායමක් ලබාගන්න පුළුවන්. එතරම් මුදල් යෙදවීමක් අවශ්‍ය නොවන නිසා අපේ ගොවි මහත්වරුන්ටත් මෙම අතුරු වගාව අමාරු කාරියක් නොවෙයි. වැඩි ආදායමක් පෝෂ්‍ය ආහාරත් මෙන්ම රැකියා ඉඩකඩත් ලබා දෙන මෙවැනි අතුරු වගාවක වටිනාකම ගොවි මහත්වරුන්ට වටහාගන්න හොඳ අවස්ථාවක් තමයි මේ.